# 16. කුක්කුටො

## සොළසමො පාඨො



මනුස්සානං පක්ඛීසු කුක්කුටො උපකාරකො. තස්මා බහවො මනුස්සා කුක්කුටෙ පොසෙන්ති. තෙ ධඤ්ඤකණාදීනි භුඤ්ජන්ති. දිවා භාගෙ ගෙහස්ස අවිදූරෙ ඉතො චිතො ආහිණ්ඩන්ති. සූරියෙ අත්ථං ගච්ඡන්තෙ තෙ නිවාසං ආගච්ඡන්ති. රත්තියං රුක්ඛෙසු වා පඤ්ජරෙසු වා සයන්ති. තෙ සබ්බෙසං ජනානං පඨමතරං පබුජ්ඣිත්වා රවන්ති. තෙන සද්දෙන මනුස්සා පබුජ්ඣන්ති. කාලං මඤ්ඤය පාතො'ව සකෙ සකෙ කම්මෙ නියුජ්ජන්ති. කුක්කුටස්ස සිරසි චූළා වත්තතෙ. න තථා කුක්කුටියා සිරසි. තතො කුක්කුටියා අධිකතරං කුක්කුටො සොභතෙ.

කුක්කුටියා අණ්ඩෙහි සාබකා උප්පජ්ජන්ති. කුක්කුටපොතකා කුක්කුටියා සද්ධිං සඤ්චරන්ති. අපි නු ත්වං ඉච්ඡසි කුක්කුටෙ පොසෙතුං ?

**(පාලි රචනා 1 පණ්ඩිත බද්දේගම විමලවංස අනුනාහිමි)**

## වචන මාලාව

1. කුක්කුටො - කුකුළා
2. උපකාරකො - උදව්කරුවා
3. තස්මා - ඒ නිසා
4. පොසෙති - පෝෂණය කරයි
5. ධඤ්ඤකණාදීනි - ධාන්‍ය කැබලි
6. අවිදූරෙ - නුදුරෙහි
7. ඉතො චිතො - ඔබ මොබ
8. ආහිණ්ඩන්ති - ඇවිදිති
9. පඤ්ජරෙසු - කූඩුවල
10. රවති - නාද කරයි
11. මඤ්ඤූස - දූන
12. සකෙ සකෙ - තම තමන්ගේ
13. නියුජ්ජන්ති - යෙදෙත්
14. සිරසි - හිසේ
15. චූළා - කරමලය (කුඩුම්බිය)
16. සාබකා - පැටවු

## සත්තමී විභක්තිය

ඉහත ඡේදයේ ඉරි ඇඳි වාක්‍ය දෙස නැවත බලන්න.

- තෙ <u>රුක්ඛෙසු</u> වා <u>පඤ්ජරෙසු</u> වා සයන්ති.

  (ඔවුහු <u>ගස්වල</u> හෝ <u>කූඩුවල</u> නිදාගනිති.)
- ඔවුන්ට නිදා ගැනීමට උපකාර වූ ස්ථාන කියවෙන පද තබා ඇත්තේ සත්තමී විභක්තියෙනි.
- ගස හා කූඩුව කුකුළාට නිදා ගැනීමට ආධාර වී ඇත.

- ගෙහි, කෙරෙහි, වල, මත ආදී ආධාර බවක් කියවෙන විට ඒ පදය සත්තමී විභක්තියෙන් තබනු ලැබේ.

**සත්තමී විභක්තිය යෙදී ඇති මේ වගන්ති බලන්න.**

- මන්තිනො ගාමෙසු චරන්ති - මන්ත්‍රීවරු ගම්වල ඇවිදිති.
- හීයො අහං ගිරිසු පක්ඛිනො අපස්සිං - ඊයේ මම කඳුවල පක්ෂීන් දුටුවෙමි.
- මච්ඡා උදධීසු ජීවන්ති - මාළුවෝ මුහුදුවල ජීවත් වෙති.
- මුනයො සෙට්ඨිනො පාසාදෙ දානං භුඤ්ජිංසු - මුනිවරු සිටුවරයාගේ ප්‍රාසාදයේ දන් වැළඳූහ.
- දීපියො අටවීසු මිගෙ මාරෙන්ති - දිවියෝ කැලෑවල මුවන් මරති.

**සත්තමී විභක්තියේ නාමපද වරනැගෙන අයුරු බලන්න.**

| සත්තමී විභක්තිය | | |
|---|---|---|
| නාමය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං | බුද්ධෙසු |
| අග්ගි | අග්ගිම්හි, අග්ගිස්මිං | අග්ගිසු |
| දණ්ඩී | දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | දණ්ඩීසු |
| භික්ඛු | භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛුසු, භික්ඛූසු |
| කඤ්ඤා | කඤ්ඤායං, කඤ්ඤාය | කඤ්ඤාසු |
| නදී | නජ්ජං, නදියං, නදියා | නදීසු |
| චිත්ත | චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං | චිත්තෙසු |

| | | |
|---|---|---|
| සබ්බ | සබ්බම්හි, සබ්බස්මිං | සබ්බේසු |
| ඉම | අම්හි, අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

## අභ්‍යාසය 16 1

1. සිංහලට නගන්න.
    1. අයං කුක්කුටො ගාමෙ ජීවති.
    2. ත්වං ඉමිනා අග්ගිනා ගෙහෙසු පදීපානි ජාලෙසි.
    3. ඉමස්මිං නගරෙ පණ්ණසාලං නත්ථි.
    4. හත්ථිනො ගෙහෙසු න වසිස්සන්ති.
    5. සාරථිනො අසෙස රථෙසු බන්ධිංසු.

2. පාලියට නගන්න.
    1. මේ පන්සලේ භික්ෂූහු වාසය කරති.
    2. වඳුරෝ ගස්වල ජීවත් වන්නාහ.
    3. සාගරවල මැණික් ඇත.
    4. නැව ගංගාවල ගමන් නොකරයි.
    5. තෝ මේ කඩු රථවල තබහි.

3. ඔබ දන්නා නාම පහක් යොදා ගෙන සත්තමී විභක්ත්‍යන්ත පදය ඇතුළත් වන සේ වගන්ති පහක් නිර්මාණය කරන්න.

4. පාඩමේ ඇති ඡේදය සිංහලට නගන්න.

5. අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත ආදී ඔබ මෙතෙක් උගත් සියලු ශබ්දවල වෙනස්කම් හොඳින් බලා නැවත කියවා පුහුණු වන්න.

**මෙම ශබ්දය වාචෝද්ග්‍රහණය කරන්න**

| අකාරාන්ත පුලලිඞ්ග "ඉම" ශබ්දය (මේ, මොහු, මෙතෙම) | | |
|---|---|---|
| **විභක්තිය** | **ඒකවචන** | **බහුවචන** |
| **පඨමා** | අයං | ඉමෙ |
| **ආලපන** | --- | --- |
| **දුතියා** | ඉමං | ඉමෙ |
| **තතියා** | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙභි, ඉමෙහි |
| **කරණ** | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙභි, ඉමෙහි |
| **චතුත්ථි** | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| **පඤ්චමී** | අම්හා, අස්මා, ඉමම්හා, ඉමස්මා | එහි, එභි, ඉමෙභි, ඉමෙහි |
| **ඡට්ඨී** | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| **සත්තමී** | අම්හි, අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |